**2023.01.09 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

1. බී. කන්දසාමි මයා - ගරු සභාපති
2. වයි.එම්.නිමල් අමරසිරි මයා - ගරු උපසභාපති
3. එස්. සගාදේවන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
5. කේ.එම්. විමලසිරි මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
7. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
8. ගෝපාලන් මුරුගන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
9. එල්.එච්. ඉන්දික සම්පත් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
10. ඩී.සුදත් අරුණ රංජන මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
11. සවරිමුත්තු ප්‍රභාහර් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. එෆ්. වයලට් රෝස් මහත්මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
13. මාරප්පන් කන්දසාමි මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
14. තංගවේලු මහේන්ද්‍රන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
15. වේලුසාමි එලීල් අරසි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
16. එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
17. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
18. ආර්.එල්.සුදර්ශන මහතා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

**01.පසුගිය රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.12.13 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සහා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සහා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්. එල්. සුදර්ශන මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත**

**03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන**

**නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

**නැත**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත එක් එක් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබා දීම පිණිස කාරක සභා සභිකවරුන්ට යටත්ව කාරක සභා පිහිටුවීමට මහ සභාවට යෝජනා කිරීම සුදුසු බව 2023-01-02 වන දින පැවති මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද හෙයින් එකී කමිටු පත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

- මුදල් හා ප්‍රතිපත්ති කමිටුව
- නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
- කාර්මික සේවා
- පරිසර සහ පහසුකම්

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා</u>

<u>විවාද</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත එක් එක් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබා දීම පිණිස කාරක සභා සභිකවරුන්ට යටත්ව කාරක සභා පිහිටුවීමට මහ සභාවට යෝජනා කිරීම සුදුසු බව 2023-01-02 වන දින පැවති මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද හෙයින් එකී කමිටු පත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

- මුදල් හා ප්‍රතිපත්ති කමිටුව
- නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
- කාර්මික සේවා
- පරිසර සහ පහසුකම්

ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් ඉදිරි ප්‍රාදේශීය සභා ධූර කාලය සඳහා ක්‍රියාත්මක කිරීමට පත් කරනු ලබන කමිටු සඳහා 2022 වර්ෂයේ පත් කර ගන්නා ලද සභිකයන් ම 2023 වර්ෂය සඳහා ද පත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉහත එක් එක් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබා දීම පිණිස කාරක සභා සභිකවරුන්ට යටත්ව කාරක සභා පිහිටුවීම 2022 වර්ෂයේ පත් කරන ලද කමිටු සමාජිකයන්ම 2023 වර්ෂය සඳහා ද පත් කිරීම සුදුසු බවටත් 2022 වර්ෂයේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය නියෝජනය කරන ලද කමිටු සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා පත් කිරීම සුදුසු බවටත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා නියෝජනය කරන ලද කමිටු සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී. එලීල් අරසි මහත්මිය පත් කිරීම සුදුසු බවට යෝජනා වූ බැවින් ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභා අරමුදලෙන් කරනු ලබන සෑම වියදමක් සම්බන්ධයෙන් ද එසේම අරමුදලට රැස්කරනු ලබන සෑම ආදායමක් සම්බන්ධයෙන්ද ඊට අදාල වන ක්‍රියාමාර්ග හා ආනුෂාංගික ක්‍රියා මාර්ග වෙනුවෙන් සභාවට උපදෙස් ලබාදීම පිණිසද හා ඊට අතිරේක වශයෙන් මතුවට සම්මත කරනු ලබන යෝජනාවක් යටතේ සභාව විසින් පවරා දෙනු ලබන කවර හෝ බලතල ඇත්නම් එම බලතල

ක්‍රියාත්මක කිරීම පිණිස 2023 වර්ෂයට මෙම ප්‍රාදේශිය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවක් පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය හා පවරනු ලබන බලතල නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

**සංයුතිය -**

ගරු මන්ත්‍රීවරුන් 06 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සභාපති වන්නේය.

**බලතල**

- සභා අරමුදලෙන් සිදු කරනු ලබන සියළුම පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් නිර්දේශ කිරීමත් වරකට රුපියල් ලක්ෂ 5 ක් දක්වා වූ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් අනුමත කිරීම.

- ප්‍රාදේශීය සභාවෙහි ප්‍රසම්පාදන කමිටුව ලෙස කටයුතු කිරීම.

- ලක්ෂ 02 දක්වා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව ගරු සභාපතිවරයාට බලතල පැවරීම.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාවේ සභා අරමුදලෙන් කරනු ලබන සෑම වියදමක් සම්බන්ධයෙන් ද එසේම අරමුදලට රැස්කරනු ලබන සෑම ආදායමක් සම්බන්ධයෙන්ද ඊට අදාල වන ක්‍රියාමාර්ග හා ආනුශාංගික ක්‍රියා මාර්ග වෙනුවෙන් සභාවට උපදෙස් ලබාදීම පිණිසද හා ඊට අතිරේක වශයෙන් මතුවට සම්මත කරනු ලබන යෝජනාවක් යටතේ සභාව විසින් පවරා දෙනු ලබන කවර හෝ බලතල ඇත්නම් එම බලතල ක්‍රියාත්මක කිරීම පිණිස 2023 වර්ෂයට මෙම ප්‍රාදේශිය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවක් පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය හා පවරනු ලබන බලතල නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2023 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 06 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සවරිමුත්තු ප්‍රභාගර් මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය

ඒ අනුව 2023 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්.විමලසිරි මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාවේ තත්කාර්ය අතුරු ආග්‍රිමය ලෙස රු 100,000.00ක මුදලක් සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නීය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාවේ තත්කාර්ය අතුරු ආග්‍රිමය ලෙස රු 100,000.00ක මුදලක් සභා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සභා පනතේ 133 වන වගන්තිය සමඟ කියවිය යුතු 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂය සඳහා චෙක්පත් අත්සන් කිරීමේ දී ඒ සඳහා පළමු අත්සන සභා ලේකම් ද දෙවන අත්සන ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.එම්.ජේ.ඩී. අනුර බණ්ඩාර මහතා හා මූල්‍ය සහකාර ඒ.ජී. ආර්. ධර්මකීර්ති මහතා වෙතද පැවරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

ප්‍රාදේශීය සභා පනතේ 133 වන වගන්තිය සමඟ කියවිය යුතු 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂය සඳහා චෙක්පත් අත්සන් කිරීමේ දී ඒ සඳහා පළමු අත්සන සභා ලේකම් ද දෙවන අත්සන ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.එම්.ජේ.ඩී. අනුර බණ්ඩාර මහතා හා මූල්‍ය සහකාර ඒ.ජී. ආර්. ධර්මකීර්ති මහතා වෙතද පැවරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල අනවසර ඉදිකිරීම්. පාරිසරික ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකී ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් නාගරික සීමාවන්ට පරිබාහිර බල ප්‍රදේශයේ ඉදි කරනු ලබන ගොඩනැගිලි ඉදිකිරීම් විධිමත් කිරීම පිණිස අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීම පිණිසත් හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් නිවාස. හා ප්‍රජා සංවර්ධන කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා</u>

<u>විවාදය</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල අනවසර ඉදිකිරීම්. පාරිසරික ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකී ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් නාගරික සීමාවන්ට පරිබාහිර බල ප්‍රදේශයේ ඉදි කරනු ලබන ගොඩනැගිලි ඉදිකිරීම් විධිමත් කිරීම පිණිස අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීම පිණිසත් හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් නිවාස. හා ප්‍රජා සංවර්ධන කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2023 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සෙල්ලයියා සගාදේවන් මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මාරප්පන් කන්දසාමි මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටී. මහේන්ද්‍රන් මහතා

ඒ අනුව 2023 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල පාරිසරික ගැටලු හා සෞඛ්‍ය පහසුකම් පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකී ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා

නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නීය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල පාරිසරික ගැටලු හා සෞඛ්‍ය පහසුකම් පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකී ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2023 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටු සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ප්‍රැන්ස්සි වයලට් රෝස් මහත්මිය
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.එලීල් අරසි මහත්මිය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි එම්.ඒ. නිල්මිණි චන්ද්‍රකාන්ති මහත්මිය

ඒ අනුව 2023 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රිවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එල්. සුදර්ශන මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සවරිමුත්තු ප්‍රභාහර් මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල කාර්මික සේවා හා තක්ෂණික කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් කාර්මික සේවා තාක්ෂණික කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි. එම්. නිමල් අමරසිරි මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල කාර්මික සේවා හා තක්ෂණික කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් කාර්මික සේවා තාක්ෂණික කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2023 වර්ෂය සඳහා කාර්මික සේවා තාක්ෂණික කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 04 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් කාර්මික සේවා තාක්ෂණික කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය සඳහා කාර්මික සේවා තාක්ෂණික කමිටු සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වේලුසාමි එලීල් අරසි මහත්මිය
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල්. සුදර්ශන මහතා

ඒ අනුව 2023 වර්ෂය සඳහා කාර්මික සේවා තාක්ෂණික කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රිවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සී. කිත්සිරි පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව තුල පුස්තකාල කමිටුවක් ස්ථාපිත කිරීම තුලින් පුස්තකාල කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් පුස්තකාල කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව තුල පුස්තකාල කමිටුවක් ස්ථාපිත කිරීම තුලින් පුස්තකාල කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එහි නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් පුස්තකාල කමිටුවක් 2023 වර්ෂය සඳහා පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

2023 වර්ෂය සඳහා පුස්තකාල කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරියන් 02 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් පුස්තකාල කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව පෙර වර්ෂවල සිටි නිලධාරින් ද ඇතුලුව පුස්තකාල කමිටුව පත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

2023 වර්ෂය සඳහා පුස්තකාල කමිටු සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වේලුසාමි එලීල් අරසි මහත්මිය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය

ඒ අනුව 2023 වර්ෂය සඳහා පුස්තකාල කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රිවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සවරිමුත්තු ප්‍රභාහර් මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටුව ලෙස පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීම සුදුසු බවත්,

01. ප්‍රධාන කළමනාකරණ සහකාර - කේ.එම්.ජේ.ඩී.අනුර බණ්ඩාර මයා
02. කාර්මික නිලධාරී - ආර්.එම්. ආනන්ද උපතිස්ස මයා
03. සංවර්ධන නිලධාරී - ඒ.ජේ.එම්. පාලිත ජයසුන්දර මයා

තවද, අවශ්‍ය වන සුවිශේෂී අවස්ථාවල අදාළ තාක්ෂණ සේවා පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත සාමාජිකයෙකු බාහිර ආයතනයකින් පත් කිරීම සුදුසු බවද, යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටුව ලෙස පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීම සුදුසු බවත්,

04. ප්‍රධාන කළමනාකරණ සහකාර - කේ.එම්.ජේ.ඩී.අනුර බණ්ඩාර මයා
05. කාර්මික නිලධාරී - ආර්.එම්. ආනන්ද උපතිස්ස මයා
06. සංවර්ධන නිලධාරී - ඒ.ජේ.එම්. පාලිත ජයසුන්දර මයා

තවද, අවශ්‍ය වන සුවිශේෂී අවස්ථාවල අදාළ තාක්ෂණ සේවා පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත සාමාජිකයෙකු බාහිර ආයතනයකින් පත් කිරීම සුදුසු බවද, ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 10**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියට (LDSP) අදාළ performance Transfer ($PT_2$) ක්‍රියාකාරකම් යටතේ සංවර්ධන යෝජනා ඉටු කිරීම සඳහා තීන්දු තීරණ ගැනීම උදෙසා ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 7-13 වගන්ති අනුව ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු සංයුතිය පහත පරිදි විය යුතු බව දක්වා ඇත.

1. ප්‍රසම්පාදන කමිටු සභාපති - ගරු සභාපති
2. සාමාජිකයින් - ගරු මන්ත්‍රී මණ්ඩල නියෝජනයන් 03

3. කාර්ය මණ්ඩල - නියෝජනයන් 02
-සභා ලේකම්
-ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි
4. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් නම් කරන නියෝජනයන් 01
- එල්.ආර්.ඩී.එම්. එස්.යූ බණ්ඩාර හල්පේ මයා

ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියට (LDSP) අදාළ performance Transfer ($PT_2$) ක්‍රියාකාරකම් යටතේ සංවර්ධන යෝජනා ඉටු කිරීම සඳහා තීන්දු තීරණ ගැනීම උදෙසා ප්‍රසම්පාදන කමිටුව සඳහා ඉහත සංයුතිය ද ඇතුළුව සාමාජිකයින් 07 සඳහා ගරු මහජන නියෝජිතයන්ගේ නියෝජනයන් 03 නම් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා</u>

<u>විවාද</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියට (LDSP) අදාළ performance Transfer ($PT_2$) ක්‍රියාකාරකම් යටතේ සංවර්ධන යෝජනා ඉටු කිරීම සඳහා තීන්දු තීරණ ගැනීම උදෙසා ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 7-13 වගන්ති අනුව ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු සංයුතිය පහත පරිදි විය යුතු බව දක්වා ඇත.

1. ප්‍රසම්පාදන කමිටු සභාපති - ගරු සභාපති
2. සාමාජිකයින් - ගරු මන්ත්‍රී මණ්ඩල නියෝජනයන් 03
3. කාර්ය මණ්ඩල - නියෝජනයන් 02
-සභා ලේකම්
-ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි
4. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් නම් කරන නියෝජනයන් 01
- එල්.ආර්.ඩී.එම්. එස්.යූ බණ්ඩාර හල්පේ මයා

ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියට (LDSP) අදාළ performance Transfer ($PT_2$) ක්‍රියාකාරකම් යටතේ සංවර්ධන යෝජනා ඉටු කිරීම සඳහා තීන්දු තීරණ ගැනීම උදෙසා ප්‍රසම්පාදන කමිටුව සඳහා ඉහත සංයුතිය ද ඇතුළුව සාමාජිකයින් 07 සඳහා ගරු මහජන නියෝජිතයන්ගේ නියෝජනයන් 03 නම් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව ගරු මන්ත්‍රී මණ්ඩල නියෝජනයන් 03 ලෙස

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය

යන සභිකයන් තිදෙනාගේ නම් යෝජනා විය.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 11**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියට (LDSP) අදාළ performance Transfer ($PT_2$) ක්‍රියාකාරකම් යටතේ සංවර්ධන යෝජනා ඉටු කිරීම උදෙසා අවශ්‍ය තාක්ෂණික මග පෙන්වීම් සැපයීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම උදෙසා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත සඳහන් නිලධාරීන් ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 7-13 වගන්ති අනුව පත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

- දිස්ත්‍රික් ඉංජිනේරු - ටී.සෙන්දිල් කුමාර් මයා — කමිටු සභාපති
  ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP)
- සංවර්ධන නිලධාරි - එස්.එම්.එස්.යූ. සමරකෝන් මයා — කමිටු සාමාජික
  පළාත් පාලන දෙපාර්තමේන්තුව
- කාර්මික නිලධාරි - ආනන්ද උපතිස්ස මයා — කමිටු සාමාජික
  හපුතලේ ප්‍රාදේශීය සභාව

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා</u>

<u>විවාද</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියට (LDSP) අදාළ performance Transfer ($PT_2$) ක්‍රියාකාරකම් යටතේ සංවර්ධන යෝජනා ඉටු කිරීම උදෙසා අවශ්‍ය තාක්ෂණික මග පෙන්වීම් සැපයීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම උදෙසා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත සඳහන් නිලධාරීන් ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 7-13 වගන්ති අනුව පත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

- දිස්ත්‍රික් ඉංජිනේරු - ටී.සෙන්දිල් කුමාර් මයා — කමිටු සභාපති
  ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP)
- සංවර්ධන නිලධාරි - එස්.එම්.එස්.යූ. සමරකෝන් මයා — කමිටු සාමාජික
  පළාත් පාලන දෙපාර්තමේන්තුව
- කාර්මික නිලධාරි - ආනන්ද උපතිස්ස මයා — කමිටු සාමාජික
  හපුතලේ ප්‍රාදේශීය සභාව

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 12**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2023 වර්ෂයේ පෙබරවාරි මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජන කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා</u>

<u>විවාද</u>

2023 වර්ෂයේ පෙබරවාරි මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස 2023 පෙබරවාරි මස 06 වන දින තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වර්තාව**

2022.02. වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 දෙසැම්බර් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

නැත

**08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.**

ගරු සභාපතිතුමන් විසින් වෙනත් කරුණු අවස්ථාවේදී ප්‍රථමයෙන් අදහස් දක්වමින් ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය දෙවන අදියර යටතේ ජයග්‍රහණයක් ලබා ගන්නා ලෙස ගරු ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය වෙත වගකීමක් භාර දෙන ලද අතර එකී වගකීම පරිදි ගරු ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය විසින් ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ පවත්වන ලද ප්‍රශ්නාවලියෙන් ශ්‍රී ලංකාවෙන් ම ප්‍රථම ස්ථානය ලබාගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් කරන ලද කැප කිරීම සම්බන්ධයෙන් ස්තුතිය ප්‍රකාශ කරන බවත්, හපුතලේ ප්‍රාදේශීය සභාව වෙත රුපියල් මිලියන 36ක ප්‍රතිපාදනයක් හිමිවන බවත් එය අප බල ප්‍රදේශයේ ප්‍රජාව වෙනුවෙන් ගරු ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය විසින් කරන ලද විශාල මෙහෙවරක් බැවින් ඒ සඳහා ස්තුතිය ප්‍රකාශ කරන බව ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපතිතුමන් විසින් අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභාවට විශේෂයෙන්ම අඩුවක්ව පවතින ගලිවලක් සෑදීමට මෙම ව්‍යාපෘතිය යටතේ කටයුතු සිදුකළ නොහැකිද යන්නත් විමසන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඒ සඳහා පර්චස් 20ක නිදහස් ඉඩමක් අවශ්‍ය බව එකී ව්‍යාපෘති නිර්ණායක යටතේ සඳහන් බැවින් එය සිදු කළ නොහැකි බවත් එවැනි භූමි කොටසක් පවරා ගැනීමට හෝ බල ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක් නොමැති බවත් මීත් පෙර අවස්ථා වලදී ද ගලිවලක් සෑදීමට උත්සාහ දැරූ අතර එකී සෑම උත්සාහයක්ම ව්‍යර්ථ වූ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගොපාලන් මුරුගන් මහතා අදහස් දක්වමින් 2018 වර්ෂයේ සිට වසර 05ක් පුරා සභා කාලය පැවති අතර තමා 2011 වර්ෂයේ සිට වසර 10ක පමණ කාලයක් ක්‍රියාකාරී දේශපාලනයේ යෙදුණු බවත් ප්‍රකාශ කරන ලදී. අතීතයේ මෙන් නොව වත්මන් වසර 02ක් වැනි කාලය තුළ දේශපාලන තුළ ඇති විවිධ අස්ථාවරභාවයත් සමඟ ප්‍රජාවට දේශපාලනය හෑල්ලුවට ලක්ව ඇති බවත් මන්ත්‍රීකම යනු ගරුත්වයක් සහිත තනතුරක් බවත් ක්‍රියාකාරී දේශපාලනයේ රැඳී සිටින විට ප්‍රජාව වෙනුවෙන් වැඩ කිරීමට හැකියාව පවතින බවත් දේශපාලන ගමන තුළ තවදුරටත් ඉදිරියට ගමන් කළ හැකි බව තම පෞද්ගලික මතය බවත් ප්‍රකාශ කරන ලදී.

එසේම හපුතලේ ප්‍රාදේශීය සභාව යනු ඉතා හොඳ මන්ත්‍රී මණ්ඩලයක් සහිත බවත් වෙනත් සබා මෙන් නොව ගැටුම්වලින් තොර සභාවක් බවත් ප්‍රකාශ කළ අතර සභිකයන් 20 දෙනාම නැවතත් මෙම සභාවට ඉදිරියේදී පත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇතැයි තම මතය බවද ප්‍රකාශ කරන ලදී. දෙවැනි කරුණු වශයෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙසම නොව තමා මිනිසකු ලෙස තම සේවය අවශ්‍ය ඕනෑම මොහොතක ප්‍රජාවට ලබාදීමට කටයුතු සිදු කළ යුතු බවත් පක්ෂ සංවිධානයක් සමඟ ඒකාබද්ධව දීර්ඝ කාලීනව කටයුතු කිරීම සුදුසු බවත් ඉදිරියේ දී පවත්වනු ලබන මැතිවරනයේ දී තමා හපුතලේගම කොට්ඨාසයෙන් හෝ හපුතලේ කොට්ඨාසයෙන් සමගි ජන බලවේගය පක්ෂයෙන් තරඟ කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.විමලසිරි මහතා අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා විසින් සිදු කළ ප්‍රකාශය සම්බන්ධයෙන් තම ස්තුතිය ප්‍රකාශ කරන බවත් මෙම සභාව වෙනත් සභාවක් මෙන් නොව ඉතා සමගියෙන් කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී. රටේ පැවති ස්වයං පෝෂිත ආර්ථිකය 1977න් පසු කුමන්ත්‍රණකාරී දේශපාලනයෙන් විනාශ වූ බවත් දීර්ඝව පැහැදිලි කරන ලදී. තමා ඇතුළු ගරු සභික මණ්ඩලය සභාවට පැමිණියේ ප්‍රදේශයට සේවයක් කිරීමට බවත් එය නිසි ආකාරයට සිදු කිරීමට නොහැකි වූ බවත් නැවත පත් වීම් ලබා පැමිණෙන මන්ත්‍රීවරුන් අවංකව තම ප්‍රදේශය සංවර්ධනය කිරීමට කටයුතු කරන්න යැයි ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.විමලසිරි මහතා පිළිබඳව අදහස් දක්වමින් තම බල ප්‍රදේශය තුළ එතුමන් තම වගකීම මැනවින් ඉටු කරනු ලබන නායකයෙකු බවත් අනවශ්‍ය කටයුතු සිදුවන්නේ නම් ඒ සම්බන්ධයෙන් එතුමා ඍජුව මැදිහත් වන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.සුදර්ශන මහතා අදහස් දක්වමින් නවක මන්ත්‍රීවරයෙකු ලෙස සභාවට පැමිණෙන විට ගරු සභාපතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී මණ්ඩලය නිවැරදි මඟ පෙන්වීමක් ලබා දුන් බවත් ඉදිරි කටයුතු සඳහා සෑම විටම උදව් උපකාර කළ බවත් ප්‍රකාශ කරන ලදී.එසේම වසර 05කට ආසන්න කාලයක් පැවති සභා කාලය තුළ සභික මණ්ඩලය විසින් සිදුකරන ලද කර්තව්‍යයන් සියල්ල ඡායාරූප සමඟ වෙබ් පිටුවකට එකතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. එසේම දියතලාව නගරයේ ඉදිකර ඇති වැසිකිළිය ප්‍රජාවට ලබාදීමට කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික සම්පත් මහතා අදහස් දක්වමින් දියතලාව නගරයේ බස් නැවතුම්පොළ භූමියෙහි ඉදි කර ඇති මල්පාත්ති වල පස් ඉවත් කර ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.